තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන ධාරිතා ගොඩ නැංවීමේ ව්‍යාපෘතිය - 2012
----------------------------------------------------------------------------------------------------

1. මතය
-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2012 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාස 10ක කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 ඔක්තෝබර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබු අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පුරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 ඔක්තෝබර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති නියමයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මුල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2. මුල්‍ය ප්‍රකාශන
-----------------

2.1 මුල්‍ය කාර්ය සාධනය
-------------------------

මුල්‍ය ප්‍රකාශනවලට සහ ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව 2012 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාස 10ක ගිණුම් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.6,383,932 ක් වූ අතර 2012 ඔක්තෝබර් 31 දිනට සමුච්චිත වියදම රු.37,898,657 ක් විය. සමාලෝචිත ගිණුම් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම පෙර වර්ෂයේ වියදම හා 2012 ඔක්තෝබර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2012 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාස 10 ක කාල පරිච්ඡේදය සඳහා වියදම් | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2012 ඔක්තෝබර් 31 දිනට සමුච්චිත වියදම් |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| උපදේශක සේවා | - | 21,097,012 | 25,583,658 |
| භාණ්ඩ හා උපකරණ | - | - | 1,375,067 |
| පුහුණු හා වැඩමුළු | 6,383,932 | 4,556,000 | 10,939,932 |
| එකතුව | 6,383,932 | 25,653,012 | 37,898,657 |

## 2.2 විශේෂ (ඩොලර්) ගිණුම

මුල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2011 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාස 10 ක කාල පරිච්ඡේදය තුළ විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් හා එම දිනට ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 2,661 | 303,048 |
| එකතු කළා: ඌන පූර්ණයන් | 75,000 | 9,579,615 |
| විදේශ විනිමය වාසිය | - | 199,323 |
| | 77,661 | 10,081,986 |
| අඩු කළා: | | |
| ආපසු ගැනීම් | (49,220) | (6,383,932) |
| 2012 ඔක්තෝබර් 31 දිනට ශේෂය | 28,441 | 3,698,054 |

3. විගණන නිරීක්ෂණ
----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

3.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

ප්‍රදාන ගිවිසුමේ 11 ව්‍යවස්ථාවේ 2.04 (ඇ) වගන්තිය අනුව එක් එක් ගිණුම් කාල පරිච්ඡේදය අවසන් වි මාස 06 කට පෙර විගණිත මුල්‍ය ප්‍රකාශන ලෝක බැංකුව වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත් 2012 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් වු මාස 10ක කාල පරිච්ඡේදය සඳහා වු මුල්‍ය ප්‍රකාශන 2013 මැයි 23 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පුහුණු සහ වැඩමුළු සඳහා 2012 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් වු මාස 10ක කාල පරිච්ඡේදය තුළ දරන ලද රු.1,620,993 ක තථ්‍ය වියදම සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාළ මුල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ වියදමක් ලෙස සලකා තිබුණි.

3.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකුල නොවීම.
--------------------------------------------------

ප්‍රදාන ගිවිසුමේ 11 ව්‍යවස්ථාවේ 2.03 වගන්තිය අනුව ක්‍රියාත්මක කිරිමේ නියෝජිතායතනය විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී ව්‍යාපෘතියේ ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීම කර ඒ පිළිබඳ ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කළ යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය විසින් එවැනි වාර්තාවක් 2012 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා සහ ඉකුත් කාල පරිච්ඡේද සඳහා පිළියෙල කර නොතිබුණි.

3.4 සැලසුම් හා අධීක්ෂණය
-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ නිශ්චිත කාලය තුළ ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම උදෙසා මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂිකව අපේක්ෂා කරන මුල්‍ය හා භෞතික ඉලක්කයන් සඳහන් කරමින් ව්‍යාපෘතියේ සම්පූර්ණ කාල පරිච්ඡේදයම ආවරණය වන

පරිදි විස්තරාත්මක සමස්ථ සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද, එවැනි සැලැස්මක් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩලයේ ප්‍රධානීන් විසින් ඉටු කරගත යුතු ඉලක්කයන් සමඟ වගකීම් හා සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ සිදු කළ යුතු කාර්යයන්ට අදාළ අයවැයගත වෙන්කිරීම් පැහැදිලිව හඳුනා ගත හැකි වන පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මේ හේතුවෙන් ළඟා කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණුවලට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමෙන් හා නිවැරදි ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය නියමිත පරිදි ඇගයීම් කළ නොහැකි විය.

මේ පිළිබඳව මාගේ පෙර වර්ෂයේ වාර්තාව මහින්ද ව්‍යාපෘතියේ කළමනාකාරිත්වයේ අවධානයට යොමු කර තිබුණු නමුත් 2013 මැයි 31 දින දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

3.5 අරමුදල් උපයෝජනය

--------------------------

මුල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සඳහා වෙන්කරන ලද රු.52,854,276 (එ.ජ.ඩොලර් 472,634) ක මුදලින් ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසාන වන විට රු37,898,657 (එ.ජ.ඩොලර් 330,767.3) ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

3.6 කාර්ය සාධනය සමාලෝචනය

-----------------------------------

(i) මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති පරිදි ගිවිසුමේ සංරචක 01 හා 02 යටතේ සඳහන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සහ සාන්ද්‍රික ප්‍රජාව සඳහා පුහුණු කිරීම් හා වැඩමුළු පැවැත්වීම වෙනුවෙන් එ.ජ.ඩොලර් 88,320 ක මුදලක් වෙන් කරදී තිබුණු නමුත් රු.10,939,932 (එ.ජ.ඩොලර් 89,220) ක් මේ සඳහා වැය කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ නිශ්චිත කාල පරිච්ඡේදය තුළදී අරමුණු ඉටුකර ගැනීම සඳහා 2012 ඔක්තෝබර් 16 දක්වා කිසිදු දේශීය වැඩමුළුවක් පවත්වා නොතිබුණි.

(iii) භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සඳහා එ.ජ.ඩොලර් 50,000 ක් වෙන්කර තිබූ නමුත් එකී කාර්යය සඳහා උපයෝජනය කර තිබුණේ රු.1,375,067 (එ.ජ.ඩොලර් 11,547.3) ක් පමණි.